

# නාට්‍ය හා රංගකලාව

## 09 ශ්‍රේණිය

### 02 වන වාරය

- නිපුණතාව 3.0 : නාට්‍ය හා රංගකලා සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැලෙයි.
- නිපුණතා මට්ටම 3.5 : සාත්වික අභිනය භාවිතා කරයි.

# සාත්ත්වික අභිනය භාවිත කරමු

නළුවා චරිතයට අදාළ ව මුහුණින් හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීම සාත්වික අභිනයයි. ආදරය, කරුණාව, කෝපය, ශෝකය, භය, ජුගුප්සාව, වෛරය වැනි මනෝභාවයන් ප්‍රේක්ෂකයා ඉදිරියේ මැවෙන්නේ සාත්වික අභිනය හරහා ය. මුහුණේ මස් පිඬු, නළල, ඇහි බැම, ඇස, කන, නාසය, නිකට, තොල් වැනි ඉන්ද්‍රියන් තුළින් මනෝභාවයන් ප්‍රකට වේ. සාත්ත්වික අභිනය යනු මනස මූලික ව හට ගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීමයි. මෙම වෙනස්කම් චරිතවල පාලනයෙන් තොර ව සිදු වේ.

***උදා:- දහදිය දැමීම, ඇඟ වෙවුලීම, රෝමෝද්ගමනය, සිරුර දරදඬු වීම, ගැස්ම ආදිය වේ.***

සාර්ථකත්වය සඳහා සාත්ත්වික අභිනය බලපාන අතර චරිතයක අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා බෙහෙවින්ම උපකාරී වේ. වෙස්මුහුණු පලඳින අවස්ථාවක දී සාත්ත්වික අභිනයට බාධා සිදුවේ. නාට්‍යයේ ශෛලිය හා ප්‍රභේද අනුව ද සාත්ත්වික අභිනයේ වෙනස්කම් සිදුවේ. විවිධ භූමිකා මඟින් ප්‍රකට සාත්ත්වික අභිනය විවිධ වේ. චරිතයක ප්‍රබල හෝ දුබල හෝ බව ඉස්මතු වීම කෙරෙහි සාත්ත්වික අභිනය ප්‍රධාන වශයෙන් ම බලපායි.සාත්ත්වික භාව නිරූපණය වඩාත් ප්‍රබල වීමට, මැනවින් ඉදිරිපත් කරීමට, ඒ සමඟ වාචික, ආංගික, ආහාර්ය අභිනය ද එක් විය යුතු ය.

# වැඩි විස්තර මෙතනත් තියෙනවා......

- https://youtu.be/tCJ2CJQEAbg
- https://www.google.com/search?q=sattvika+abhinaya&oq=sathvika+a&aqs=chrome.1.69i57j0i10j46j0j46i10i175i199.5414j0j9&client=ms-android-huawei-rev1&sourceid=chrome-mobile&ie=UTF-8



# ගෙදර ඉන්න ගමන් කණ්නාඩියක් ඉස්සරහට ගිහින් මේ විදිහට කරලා බලන්නකෝ......

- (දුක) නිවසේ බල්ලා නොනවත්වා ම බුරමින් සිටී. ගෙහිමියා පැමිණ බල්ලාට සැර කර ඌ ලිහා දමයි. ඌ වහා පාරට පනියි. පාරේ ගමන් ගන්නා වාහනයකට බල්ලා අහු වෙයි. බල්ලා දෙස බලා ගෙහිමියා ඇතුළු පවුලේ සියලුදෙනා දැඩි ලෙස දුකටත් කම්පනයටත් පත් වෙති.
- (බිය) නිවසේ දොරට යමෙක් තට්ටු කරයි. ගෙහිමි කාන්තාව වසා තිබූ දොර ඇර බලයි. එවිට දකින්නේ යකෙකුගේ ස්වරූපය ඇත්තෙකි. ගෙහිමි කාන්තාව දැඩි ලෙස බිය වී කෑ ගසයි.
- (සතුට) තැපැල්කරු නිවසට පැමිණෙයි. සීනුව නාද වෙයි. එක් දැරියක් තැපැල්කරු වෙත දිව යයි. තැපැල්කරු ලිපියක් දිගු කරයිත දැරිය එය කඩා බලයි. සතුට දනවන කරුණක් ලිපියේ ඇති බව පෙනේ. ක්‍රමයෙන් ලිපිය කියවීමේ දී මුහුණේ ඉරියව් වෙනස් වී අධික සතුටක් ඇති වන අයුරු පෙනේ. සතුට ඉහවහා ගොස් ලිපියේ සඳහන් දේ අන්‍යයන්ට ප්‍රකාශ කිරීමට කෑ ගසමින් නිවසට දිව එයි. නිවසේ සියල්ලෝ ම ලිපිය බලා සතුට ප්‍රකාශ කාරති.
- (පිළිකුල) ළමයෙක් දිය නෑමට ළිඳට යයි. ළිඳට බාල්දිය දැමීමට හදන අවස්ථාවේ ළිඳ තුළ යමක් පෙනේ. ඇය ළිඳට එබිකම් කර බලයි. අයට සිටින්න්ට ද කථා කරයි. සියල්ලෝම ළිඳට එබී බලති. යමෙක් අසල තිබූ කොක්කක් සහිත ලීයක් ළිඳට දමා අමාරුවෙන් යමක් ගොඩ ගනී. ලීයේ පැටලී ඇත්තේ පූසෙකි. “පූසෙක්” යැයි අවට සිටින්නෝ කෑ ගසති. පූසා මිය ගොස් ය. ඌ ඉදිමී ගඳ ගසන බව අයෙක් පවසති. ඇතැමෙක් පිළිකුල අභිනයෙන් දක්වති.
- (ආදරය) මවට ඉපදුණු අලුත් මල්ලී අද නිවසට ගෙනෙන දවසයි. එක් දරුවෙක් අම්මාත් තාත්තාත් මල්ලී ගෙනෙන තුරු මඟ බලමින් සිටී. (වාහනයක ශබ්දයක් ඇසෙයි) දරුවා ඈත මෑත බලයි. අම්මා මල්ලී තුරුලු කරගෙන එනු පෙනේ. දරුවා සතුටින් උඩ පනී. ඔහු අම්මා එන ඉදිරියට දිව යයි. අම්මා අත පහත් කර චූටි මල්ලියා දරුවාට පෙන්වයි. ඔහුට ඉමහත් සතුටක් දැනෙයි. ගෙදර සියල්ලෝ ම දුවවිත් අලුත උපන් බිළිඳාගේ හැඩරුව බලා සතුටු වෙති.

- නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුවේ සැකසුමකි.